අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/05/67/28/06 (VI වෙළුම) | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.06.27 |

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ විදුහල්පතිවරුන් /

පීඨාධිපතිවරුන්/ ගුරු විදුහල්පතිවරුන්/

ගුරුමධ්‍යස්ථාන කළමනාකාරවරුන්,

<u>ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම 2024(I) සඳහා අයදුම්පත් කැඳවීම</u>

ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ (PL1), ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ (PL2) කාර්යක්ෂමතා කඩඉම 2024(I) විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මේ සමඟ අමුණා ඇති ආකෘති අංක 02 පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා වන අයදුම්පත් යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඊට අදාළ විෂය නිර්දේශයන් ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි වේ. පෙර වර්ෂවලදී හා මෙම වර්ෂයේ මෙයට පෙර පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් අසමත් වූ සහ එම අවස්ථාවල දී පෙනී සිටීමට නොහැකි වූ සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි වේ. තවද ශ්‍රේණිගත උසස්වීම් ලද සේවකයින් හට තමා උසස්වීම් ලබා ඇති ශ්‍රේණියට අදාළ කඩඉමට ද පෙනී සිටීම සඳහා අයදුම් කළ හැකි අතර නව පත්වීම්ලාභීන් ද I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය යුතු වේ. මේ සමඟ ඇති ඇමුණුම 2 හි ඇතුළත් ආකෘතිය පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.07.31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.

03. අයදුම්පත් යොමු කරන ලිපි කවරය පහත සඳහන් ආකෘතිය පරිදි විය යුතු බව ද කාරුණිකව සලකන්න.

| |
|---|
| ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ<br>කාර්යක්ෂමතා කඩඉම 2024(I)<br><br>**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,**<br>**(ඒකාබද්ධ සේවා නොවන)**<br>**අධ්‍යාපන අමාත්‍යාංශය,** |

04. පහත සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කරන ලද තනතුරුධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා ඉල්ලුම් කිරීම අවශ්‍ය නොවන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

- I වන කාර්යක්ෂමතා කඩඉම සමත් I I I වන ශ්‍රේණියේ තනතුරුධාරීන්
- I I වන කාර්යක්ෂමතා කඩඉම සමත් I I වන ශ්‍රේණියේ තනතුරුධාරීන්
- I I I වන කාර්යක්ෂමතා කඩඉම සමත් I වන ශ්‍රේණියේ තනතුරුධාරීන්

04. සේවා සහායක - රසායනාගාර හා සේවා සහායක - පුස්තකාල පත්වීම් ලද නිලධාරීන් තමාගේ වර්තමාන ශ්‍රේණියට අදාළ කුමන හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිට සමත් වී තිබේ නම් නැවත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යාන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

පිටපත්-

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රධාන කොමසාරිස් / ගුරු අධ්‍යාපන පරිපාලන | - | කරු.දැ.ගැ.ස. |
| 02. | සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් | - | කරු.දැ.ගැ.ස. |